205

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

නීතිවේදී උපාධි පාඨමාලාව - 5 වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2006

පරිසර නීතිය - LWU 3314/4334

කාලය - පැය තුනයි (03).

---

දිනය - 2006.04.21 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

*<u>ප්‍රශ්න පහකට</u> පමණක් පිළිතුරු සපයන්න.*
*අපැහැදිලි අත් අකුරුවලට ලකුණු අඩු කරනු ලැබේ.*

01. පාරිසරික ආරක්ෂණයේ ප්‍රතිඵලදායක අංගෝපාංගයන් ලෙස පහත සඳහන් සංකල්ප අධිකරණ තීරණ මඟින් සංවර්ධනය කළේ කෙසේදැයි පැහැදිලි කරන්න.

අ. පොදු භාර සිද්ධාන්තය (The Public Trust Doctrine)

ආ. අන්තර් පාරම්පරික සාධාරණත්වය (Inter - generational equity)

02. අම්පාර නගරයට ආසන්න ප්‍රදේශයක පිහිටා තිබෙන රජයේ කර්මාන්ත ශාලාවක්, ප්‍රධාන වශයෙන් පළිබෝධනාශක සහ පොහොර ඇතුළු කෘෂි රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කරයි. විශේෂයෙන් ළමුන් ද ඇතුළුව ස්වසන ආබාධ හා වකුගඩු ආබාධ සහිත පුද්ගලයින් ගණනාවක් අම්පාර රෝහලට ඇතුළත් කළ බව සොයාගෙන ඇත. ප්‍රදේශයේ වායුගෝලයට හා ජල මූලාශ්‍රයන්ට විෂ සහිත අපද්‍රව්‍ය මුදාහැරීම මේ සඳහා හේතු වී ඇත. කුඹුරු දූෂණයන්ට ලක්වීම නිසා ඒවායේ වගා කටයුතු තවදුරටත් කළ නොහැකි බැවින් එම කුඹුරුද, ප්‍රදේශය ද අත්හැර දමා යාමට මිනිසුන් පටන් ගෙන ඇත.

කොළඹ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාකාරී වන රාජ්‍ය නොවන සංවිධානයක් මෙම ගැටළුව පිළිබඳව ක්‍රියාකිරීමට හා ඒ සම්බන්ධයෙන් මූලික අයිතිවාසිකම් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවරීමට අදහස් කර ඇත. ඔවුන් ඔබගෙන් (අ) පෙත්සම හා සම්බන්ධ කාර්යය පටිපාටිකමය ප්‍රශ්න සහ (ආ) හරයාත්මක කරුණු පිළිබඳ උපදෙස් බලාපොරොත්තු වේ.

මෙම සංවිධානයට උපදෙස් දෙන්න.

03. චිරස්ථායී සංවර්ධනය පිළිබඳ ශ්‍රී ලාංකේය ප්‍රතිචාරයන්, ව්‍යවස්ථාවන්ගෙන් හා විනිශ්චිත නඩු තීරණයන්ගෙන් උදාහරණ දක්වමින් විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

04. පරිසලේසියාව (Parisalaysia) සියම්බෝව (Ciambo) අගනගරය කරගත් රාජ්‍යයකි. පදිංචිකරුවන්ට මහජන කරදරයක් උද්ගත වන අන්දමින් නගරපුරා අපද්‍රව්‍ය සංචිත පවත්වාගෙන යාම සම්බන්ධයෙන් සියම්බෝවේ නගර සභාවට එරෙහිව නගර වැසියෝ කණ්ඩායමක් නඩු පැවරීය. නඩුව විනිශ්චය කළ අධිකරණය අපද්‍රව්‍ය සංචිත වසා දැමීමට සහ අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විකල්ප ක්‍රමයක් සොයා ගන්නා ලෙස දක්වමින් නගර සභාවට එරෙහිව තහනම් නියෝගයක් පැනවීය.

නගර සභාව, අපද්‍රව්‍ය බැහැර කිරීමේ විකල්ප ක්‍රමයක් නොමැතිය යන පදනම මත දැන් අපද්‍රව්‍ය එකතු කිරීම නතර කර ඇත. එම නගරවැසියන් කණ්ඩායම ම නගර සභාවට, පාරිසරිකව ගැලපෙන ආකාරයකට අපද්‍රව්‍ය බැහැර කිරීමට බලකරන මෙන් ඉල්ලා තවත් නඩුකරයක් ගෙන ඒමට අදහස් කරයි.

පරිසලේසියාවේ නීතීන් හා නීති පද්ධතිය ශ්‍රී ලංකාවේ නීති පද්ධතියට සමාන බව උපකල්පනය කරමින් නගර වැසියන් ඔවුන්ගේ නඩුකරයේ දී කිනම් තර්ක ඉදිරිපත් කළහැකිදැයි සාකච්ඡා කරන්න.

05. "ව්‍යවස්ථාපිත නීතීන්ට වඩා අධිකරණමය ක්‍රියාකාරිත්වයන් නිසා දකුණු ආසියාතික කලාපයේ පරිසර නීතිය සංවර්ධනය වී ඇත."

ඔබ මේ ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? සුදුසු උදාහරණ දක්වමින් සාකච්ඡා කරන්න.

06. බහුජාතික සමාගමක් යාපනය වෙරළ කලාපයේ පිහිටි කැෂුවරිනා මුහුදු වෙරළේ කාමර 125 ක හෝටලයක් ඉදිකිරීමට අදහස් කරයි. මේ පිළිබඳව පාරිසරික බලපෑම් පිළිබඳ ඇගයීම් වාර්තාවක් (environmental impact assessment) [EIA] සකස් කර ඇත. උතුරු පළාත සංවර්ධනය කිරීමේ මූලිකාංගයක් ලෙස යාපන ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය දියුණු කළ යුතු යයි මෙම වාර්තාව දක්වා ඇති බැවින්, එම ව්‍යාපෘතිය උදෙසා වෙනත් ප්‍රදේශයක් ද ඇතුළුව අනෙකුත් විකල්ප සාකච්ඡාවට ලක් කර නොමැත. තවදුරටත් වාර්තාව සඳහන් කර ඇත්තේ හෝටල ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශයේ ධීවර පවුල් නැවත වෙනත් ස්ථානවල පදිංචි කිරීම අවශ්‍ය වෙතත් එමගින් ධීවර කටයුතු සම්බන්ධයෙන් එම ජනතාවට සෘණාත්මක බලපෑමක් නොවිය හැකි බවත් ය. එයට හේතුව වන්නේ දැනටමත් ආරක්ෂක හේතූන් මත ධීවර කටයුතු සීමා කර ඇති බවයි.

දින 30 කාලයක් තුළ ස්ථාන දෙකක මහජන සමාලෝචනය සඳහා වාර්තාව තබා තිබුණි. කෙසේ වුවත්, හමුදාව හා සන්නද්ධ කණ්ඩායම් අතර සිදු වූ ගැටුම් හේතුවෙන් මෙම කාලයෙන් වැඩි කොටසක් තුළ දිනකට පැය කිහිපයක්ම ඇඳිරි නීතිය ද බල පැවැත්වුණි.

ව්‍යාපෘතිය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කන්දයියා පහත සඳහන් දෑ පිළිබඳව ඔබගෙන් උපදෙස් පතයි.

අ) වාර්තාවේ හරයාත්මක කරුණුවල ප්‍රමාණාත්මක බව,

ආ) පාරිසරික බලපෑම් ඇගයීම පිළිබඳ වාර්තාවේ කාර්යය පටිපාටික විධිවිධානයන් අනුගමනය කර ඇත්ද යන්න,

07. ජෛව විවිධත්ව සම්මුතිය (Convention on Biological Diversity) යටතේ ඇති බැඳීම්වලට අනුගතවීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති නෛතික ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න.

08. සියළුම රටවල් අදාල ජාත්‍යන්තර සම්මුතීන් අත්සන් කර ඇතැයි උපකල්පනය කරමින් පහත සඳහන් ගැටළු සාකච්ඡා කරන්න.

අ. A සහ B රාජ්‍යයන් යනු , සැතපුම් 18 පළලින් යුතු මුහුදු තීරයකින් වෙන් වූ රටවල් දෙකකි. A රාජ්‍යයේ සමහරක් ප්‍රදේශ තුළ කුරුළු උණ (Bird Flu) ව්‍යාප්ත වී ඇත. කැලෑ කුරුල්ලන්ගෙන් කුරුළු උණ ව්‍යාප්ත වන බව දැනගත් දා සිට A රාජ්‍යයේ සිට B රාජ්‍යයට සංක්‍රමණය වන කැලෑ ජීවීන් අල්ලා මරාදැමිය යුතු බවට කමිටුවක් යෝජනා කළේය. මේ මගින් B රාජ්‍යයට ආවේණික කුරුළු ජීවීන් ආරක්ෂා වන බවට තර්ක කර ඇත. මේ සම්බන්ධයෙන් B රාජ්‍යයේ ජාත්‍යන්තර බැඳීම් මොනවා ද?

ආ. අගනුවරට ආසන්නව ලෝක ප්‍රසිද්ධ තෙත් භූමියක් C රාජ්‍යය සතුව ඇත. තෙත් භූමියෙන් උපරිම මූල්‍ය වාසියක් ලබා ගැනීම සඳහා එය ගොඩකර සංවර්ධනය කළයුතු බවට, ජාත්‍යන්තර සංවර්ධන බැංකුවක් යෝජනා කර සිටී. අගනුවර සංවර්ධනය කිරීමේ සැලසුමෙහි ප්‍රධාන අංගයක් ලෙස ව්‍යාපෘතියට මුදල් යෙදවීමට බැංකුව එකඟ වී සිටී. C රාජ්‍යයේ ජාත්‍යන්තර බැඳීම් සමඟ මෙම ව්‍යාපෘතිය ගැටෙන්නේ ද?

\- හිමිකම් ඇවිරිණි. -